(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැටතුන්දහස් හත්සිය දහයයි ශත පනස්හතරක (රු. 63,710.54) මුදල ද වර්ෂ 2007.09.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිතුන්දහස් එකසිය හැටඅටයි ශත අසූවක් (රු. 23,168.80) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අසූහයදහස් අටසිය හැත්තෑ නවයයි ශත තිස්හතරක් (රු. 86,879.34) ද,

(2) එකී රුපියල් හැටතුන්දහස් හත්සිය දහයයි ශත පනස්හතරක (රු. 63,710.54) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15.50%බැගින් වන පොලියක් 2007.10.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ජී. පී. ආනන්ද යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ ඔක්තෝබර් මස 30 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

උපලේඛනය

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, දකුණු ගිරුවාපත්තුවේ, කුඩාවැල්ල මෝදරවත්ත ග්‍රාමයේ මෝදරවත්ත ධීවර නිවාස යෝජනා ක්‍රමයේ පිහිටි ඉඩමට මිනුම්පති විසින් මැන සම්පාදිත අංක FVP 303 පිඹුර ප්‍රකාර ලොට් 53ට මායිම්, උතුරට : එම පිඹුරේම ලොට් 52 ද, නැගෙනහිරට : කලපුවේ සිට ප්‍රධාන පාරට ඇති පාර ද, දකුණට : ලොට් 54 ද, බටහිරට : එම පිඹුරේම ලොට් 70 ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිතුනයි දශම තුනක් (අ. 0, රූ. 0, පර්. 23.3) හෝ හෙක්ටයාර් 0.059 වපසරියකින් යුත් මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග තංගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඉසංආ/හම්/පු/30866 දනිප හි ලියාපදිංචි කර ඇත.
57267

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

02-499

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 02/3/44/00366.

ණයකරුගේ සම්පූර්ණ නම : හපුආරච්චිගේ සමන් බන්දුල ගුණරත්න.

ජා-ඇල ප්‍රසිද්ධ නොතාරිස් සී. එස්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 1266 හා 2002.03.18 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන්

හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ අසූපන්දහස් හයසිය දොළහයි ශත තිස්තුනක (රු. 3,85,612.33) මුදලක් වර්ෂ 2003.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් තුන්ලක්ෂ දහඅටදහස් දෙසිය අසූනවයයි ශත හැත්තෑහතක (රු. 3,18,289.77) මුදල ද වර්ෂ 2003.12.31 වැනි දින දක්වා පොළිය වශයෙන් රුපියල් හැටහත්දහස් තුන්සිය විසිදෙකයි ශත පනස්හයක් (රු. 67,322.56) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ අසූපන්දහස් හයසිය දොළහයි ශත තිස්තුනක (රු. 3,85,612.33) ද,

(2) එකී රුපියල් තුන්ලක්ෂ දහඅටදහස් දෙසිය අසූනවයයි ශත හැත්තෑහතක (රු. 3,18,289.77) මුදල මත අයවිය යුතු වර්ෂයකට 14.50% බැගින් වන පොළියක් 2004.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2004ක් වූ පෙබරවාරි මස 25 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසියා පත්තුවේ, අළුත්කුරු කෝරළේ, මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ මීනුවන්ගොඩ (උප කාර්යාලයේ) බුළුගහමුල්ල ග්‍රාමයේ මීනුවන්ගොඩ-වෙයන්ගොඩ පාරේ වරිපනම් අංක 193හි පිහිටි අඹගහ වත්ත නමැති ඉඩමට 1999.10.10 දින ඩබ්. ඩී. එන්. සෙනෙවිරත්න මානක තැන විසින් මැන සම්පාදිත අංක 4118 පිඹුර ප්‍රකාර ලොට් 3ට මායිම්, උතුරට : කැබලි අංක 2 ද, නැගෙනහිරට : ඒ. පී. තෝමස් අප්පුහාමි හිමිකම් කියන ඉඩම ද, දකුණට : මීනුවන්ගොඩ සිට වෙයන්ගොඩට අයිති මහා මාර්ගය ද, බටහිරට : කැබලි අංක 4 ද යන මායිම් තුළ පිහිටි පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 683/311හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

02-500

---

පීවී 62078.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394(3) වගන්තිය යටතේ "එම් අයි ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.11.19 දින සංස්ථාපිත සමාගමක් වන "එම් අයි ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "එම් අයි ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි,

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජනවාරි මස 28 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-437

---

පීවී 62641.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394(3) වගන්තිය යටතේ " වෙස්ට් ලෑන්ඩ් මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් " හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2008.01.08 දින සංස්ථාපිත සමාගමක් වන "වෙස්ට් ලෑන්ඩ් මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් " ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "වෙස්ට් ලෑන්ඩ් මෝටර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි,

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-438

පීවී 62146.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394(3) වගන්තිය යටතේ "පින්තාරු (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනතේ විධිවිධාන යටතේ 2007.11.26 දින සංස්ථාපිත සමාගමක් වන "පින්තාරු (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතු වල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත් වූ විට, "පින්තාරු (ප්‍රයිවට්) ලිමිටඩ්" නම, මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

ඩයස් කරුණාරත්න හෙට්ටිආරච්චි,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්.

2009 ජනවාරි මස 29 වැනි දින,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

02-439

---

**ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද 25239 හා 2007.09.05 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ යථා පරිදි සංස්ථාගත කර ඇත්තා වූ ද ලියාපදිංචි අංකය N(PVS) 47335 දරන්නා වූ ද ලියාපදිංචි කාර්යාලය ගම්පහ පිහිටා ඇත්තා වූ ද සමාගමක් වන "සෙනෙවි ට්‍රේඩර්ස් ඉන්ටර්නැෂල් (ප්‍රයිවට්) ලිමිටඩ්" සමාගම විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් මස 30 වැනි දිනට ඉහත කී උකස් බැඳුම්කරය මත එකී සෙනවි ට්‍රේඩර්ස් ඉන්ටර්නැෂල් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගමෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් අනූහය ලක්ෂ තිස් දහස් හයසිය දහහතරකුත් ශත හතලිස් නවයක (රු. 96,30,614.49) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් හෝ මෙම ණය පහසුකමට අදාළ විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් අනූහය ලක්ෂ තිස් දහස් හයසිය දහහතරකුත් ශත හතලිස් නවයක (රු. 96,30,614.49) මුදල සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා ඒ සඳහා වර්ෂයකට තිස්හය (36%) බැගින් හෝ මෙම ණය පහසුකමට අදාල විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොළිය ද මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය ප්‍රකාර උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 25239 දරන උකස් බැඳුම්කරය මඟින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි වෙනත් සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 25239 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, ගම්පහ මහනගර සභා බල ප්‍රදේශ සීමාව ඇතුළත, බැන්ඩියමුල්ලේ පිහිටි, දවටගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ඩී. ඒ. විජේසිංහ විසින් මැන සාදන ලද අංක W/473 හා 1994.06.18 වැනි දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 ලෙස ලකුණු කළ සියනෑ පාර වරිපනම් අංක 32/25 දරන බෙදා වෙන් කළ බිම් කට්ටියට මායිම්, උතුරට : ලොට් අංක 1 සහ ගලින් බැඳි කාණුව (Masonary Drain) ද, නැගෙනහිරට : ගලින් බැඳි කාණුව ( Masonary Drain ) සහ අසෝක මෙත්තානන්ද අබේරත්නට අයිති ඉඩම ද, දකුණට : අසෝක මෙත්තානන්ද අබේරත්නට අයිති ඉඩම සහ අජිත් සමරසිංහට අයිති ඉඩම ද, බස්නාහිරට : අජිත් සමරසිංහට අයිති ඉඩම, පාර සහ ලොට් අංක 1 ද යන මායිම් ඇතුළත පර්චස් විසිනවයකුත් දශම පහක් (අ. 0, රූ. 0, පර්. 29.5) නොහොත් හෙක්ටෙයාර් 0.0064ක බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

එල්. ජී. පෙරේරා,
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැංකුව,
අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

02-427/2

---

**ඩීඑෆ්සීසී වර්ධන බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා

ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් ටී. එස්. අයි. වැත්තෑව විසින් ලියා සහතික කරන ලද 3816 හා 2006.11.29 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, දෙදෙනාම කුරුණෑගල පදිංචි කමරදිවල ආරච්චිලාගේ නීල් කුමාරසිංහ සහ උඩුවෙල මුහන්දිරම් රාලලාගේ විජයන්ති මාලා විජේකෝන් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් මස 30 වැනි දිනට එකී කමරදිවල ආරච්චිලාගේ නීල් කුමාරසිංහ සහ උඩුවෙල මුහන්දිරම් රාලලාගේ විජයන්ති මාලා විජේකෝන් යන අයගෙන් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවට රුපියල් දෙලක්ෂ හැත්තෑ හතර දහස් පන්සිය පනස් හයකුත් ශත හතලිස් එකක (රු. 2,74,556.41) මුදලක් සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් හෝ මෙම ණය පහසුකමට අදාළ විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දෙලක්ෂ හැත්තෑ හතර දහස් පන්සිය පනස් හයකුත් ශත හතලිස් එකක (රු. 2,74,556.41) මුදල සහ 2008 දෙසැම්බර් මස 01 වැනි දින සිට වර්ෂයකට සියයට තිස්හය (36%) බැගින් හෝ මෙම ණය පහසුකමට අදාල විය හැකි වෙනත් යම් අනුපාතිකයක් මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියළු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අයකර ගැනීම සඳහා, ඉහත කී අංක 3816 දරන උකස් බැඳුම්කරය මගින් සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුව වෙත උකසක් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැණීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ සීමාසහිත ඩීඑෆ්සීසී වර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 3816 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඋඩවිල්ලි හත්පත්තුවේ, කුඩා ගල්බොඩ කෝරළේ, අස්වැද්දුම ග්‍රාමයේ පිහිටි අස්වැද්දුම වත්ත නමැති ඉඩමේ බෙදා වෙන් කළ බිම් කට්ටියක් වන උතුරට : ලොට් අංක 15 සහ ලොට් අංක 13 ලෙස ලකුණු කළ පාර ද, නැගෙනහිරට : ලොට් අංක 17 ද, දකුණට : ලොට් අංක 25 ද, බස්නාහිරට : 262 A/P අංක දරන පිඹුරේ දැක්වෙන අස්වැද්දුම වත්තේ කොටසක් ද යන මායිම් ඇතුළත බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද අංක 60/93 හා 1993 අප්‍රේල් මස 29 වැනි දින දරන පිඹුරේ ලොට් අංක 16 ලෙස දැක්වෙන, පර්චස් දහසයක (අ. 0, රූ. 0, පර්. 16) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ වෙනත් සියලු දේ. මෙයට එම පිඹුරේ දැක්වෙන පාරවල් ප්‍රයෝජනයට ගැනීමේ අයිතිය ද ඇතුළත් වේ.

එල්. ජී. පෙරේරා,
කළමනාකාර අධ්‍යක්ෂ/ප්‍රධාන විධායක නිලධාරී.

ඩීඑෆ්සීසී වර්ධන බැංකුව.
අංක 73, ඩබ්. ඒ. ඩී. රාමනායක මාවත,
කොළඹ 02.

02-427/1

---

**ඩීඑෆ්සීසී බැංකුව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වැනි වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට බදුල්ලේ ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ආනන්ද විසින් ලියා සහතික කරන ලද 10384 හා 2004 ජූලි මස 30 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, (මෙහි මින් ඉදිරියට "ණය ගැණුම්කරු" යනුවෙන් සඳහන් කරන) බණ්ඩාරවෙල දොන් පාලිත නිහාල් රූපසිංහ යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, ඔක්තෝබර් මස 31 වැනි දිනට ඉහත කී අංක 10384 දරන උකස් බැඳුම්කරය මත එකී දොන් පාලිත නිහාල් රූපසිංහ යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දසලක්ෂ අනූතුන්දහස් හැට නවයකුත් ශත තිස්හයක (රු. 10,93,069.36) මුදලක් සහ 2008 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් නවලක්ෂ අසූතුන් දහස් නවසිය අටක් (රු. 9,83,908) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩ කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද, ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දසලක්ෂ අනූතුන්දහස් හැට නවයකුත් ශත තිස්හයක (රු. 10,93,069.36) මුදල සහ 2008 නොවැම්බර් මස 01 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් නවලක්ෂ අසූතුන් දහස් නවසිය අටක් (රු. 9,83,908) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල වැඩ කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ

බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලි අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්) වර්ෂයකට සියයට අටක් (8%) ඉහළ අනුපාතිකය මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාල ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියලු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමඟ අයකර ගැනීම සඳහා ඉහත කී අංක 10384 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

### අංක 10384 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, මැදිකිඳ කොට්ඨාසයේ, මහ පළාත කෝරලේ, කිනිගම පිහිටි "උඩුහුල්පොත්අරාව" යනුවෙන් හැඳින්වෙන හා ප්‍රකට ඉඩමේ බලයලත් මිනින්දෝරු ඒ. කේ. ආනන්ද ඩබ්ලිව්. ද සිල්වා විසින් මැන සාදන ලද අංක 1275 හා 2002.12.10 දින දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන, උතුරට : බලයලත් මිනින්දෝරු ඒ. කේ. ආනන්ද ඩබ්ලිව් ද සිල්වා විසින් මැන සාදන ලද අංක 1267 දරන පිඹුරේ ලොට් අංක 6 සහ මෙම පිඹුරේ ලොට් අංක 5 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් අංක 3 සහ 5 ද, දකුණට : මෙම පිඹුරේ ලොට් අංක 3 ද, බස්නාහිරට : අංක 1267 දරන ඉහත කී පිඹුරේ ලොට් අංක 05 සහ 06 ද යන මායිම් ඇතුළත පර්චස් දහයක් (අ. 0, රූ. 0, පර්. 10) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ. මෙම ඉඩම බදුල්ලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

මෙයට මෙහි පහත විස්තර කරන මාර්ග ප්‍රවේශය බාධාවකින් තොරව පාවිච්චි කිරීමේ අයිතිවාසිකම ඇතුළත් වේ :-

ඉහත කී කිනිගම පිහිටි "උඩුහුල්පොත් අරාව" නමැති ඉඩමේ, ඉහත කී අංක 1275 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 5 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ඉහත කී අංක 1267 දරන පිඹුරේ ලොට් අංක 10 සහ මහ පාර ද, නැගෙනහිරට : එල්. කේ. සෝමපාලට අයිති ඉඩම සහ අංක 1267 දරන පිඹුරේ ලොට් අංක 8 ද, දකුණට : මෙම පිඹුරේ ලොට් අංක 4 ද, බස්නාහිරට : අංක 1275 දරන පිඹුරේ ලොට් අංක 1, 3 සහ 2 හා ඉහත කී අංක 1267 පිඹුරේ ලොට් අංක 6 ද යන මායිම් ඇතුළත පර්චස් හයකුත් දශම එකක් (අ. 0, රූ. 0, පර්. 6.1) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම. මෙම ඉඩම බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73, ගාලුපාර,
කොළඹ 03.

02-425/1

### ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. ඒ. එන්. ඩබ්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද අංක 21439 හා 2004.02.25 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, උඩුගම්පොළ, කහඳව අප්පුහාමිලාගේ දිනේෂ් සංජීව කුලරත්න යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 ඔක්තෝබර් 31 වැනි දිනට ඉහත කී අංක 21439 දරන උකස් බැඳුම්කරය මත ඉහත කී කහඳව අප්පුහාමිලාගේ දිනේෂ් සංජීව කුලරත්න යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් විසිලක්ෂ අනූපන් දහස් හත්සිය අසූනවයක (රු. 20,95,789) මුදලක් සහ 2008 නොවැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දසලක්ෂ අනූනව දහස් නවසිය හැත්තෑ දෙකක් (රු. 10,99,972) සඳහා වර්ෂයකට සියයට දහසය (16%) බැගින් පොලිය සහ රුපියල් හත් ලක්ෂ දහඅට දහස් හයසිය පනස් අටකුත් ශත පනස් තුනක් (රු. 7,18,658.53) සඳහා 2004 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භව ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහල 0.5% තීන්දු කරන අනුපාතිකයක් වන, හා එසේ ප්‍රකාශ කරන අනුපාතිකය වර්ෂයකට සියයට විසිතුනක් (23%) නොඉක්මවිය යුතු හා වර්ෂයකට සියයට දහසයට (16%) අඩු නොවිය යුතු පොලී අනුපාතිකයක් මත පොලියද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් විසිලක්ෂ අනූපන් දහස් හත්සිය අසූ නවයක (රු. 20,95,789) මුදල සහ 2008 නොවැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් දසලක්ෂ අනූනව දහස් නවසිය හැත්තෑ දෙකක් (රු. 10,99,972) සඳහා වර්ෂයකට සියයට දහසය (16%) බැගින් පොලිය සහ රුපියල් හත්ලක්ෂ දහඅටදහස් හයසිය පනස් අටකුත් ශත පනස් තුනක් (රු. 718,658.53) සඳහා 2004 අප්‍රේල් 01 වන දිනෙන් ආරම්භව ණය මුදල සම්පූර්ණයෙන් ගෙවා බේරුම් කරන තෙක් එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොලී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකයක් වන හා එසේ ප්‍රකාශ කරන අනුපාතිකය වර්ෂයකට සියයට විසිතුනක් (23%) නොඉක්මවිය යුතු හා වර්ෂයකට සියයට දහසයට (16%) අඩු නොවිය යුතු පොලී අනුපාතිකයක් මත පොලිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි සියලු දේ විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990

අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියළු මුදල් හා දරා ඇති සියලු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 21439 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස්කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය සහ එහි පිහිටි සියළු දේ කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතුයයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 21439 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, දොරණගොඩ ග්‍රාමයේ පිහිටි 'දවටගහවත්ත' නමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු කේ. කේ. ඒ. එස්. පද්මිණී විසින් මැන සාදන ලද අංක 3663 හා 2003 පෙබරවාරි 09 දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් ඒ ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ප්‍රධාන පාර සහ එම්. එච්. විජේවර්ධනගේ ඉඩම ද, නැගෙනහිරට : එච්. එම්. විජේවර්ධනගේ ඉඩම, එච්. ඒ. ලයනල් සිරිවර්ධනගේ ඉඩම සහ වී. පී. බන්දුසේන සහ තවත් අයට අයිති ඉඩම ද, දකුණට : වී. පී. බන්දුසේන සහ තවත් අයට අයිති ඉඩම ද, එච්. ඒ. සයිමන් ගුණරත්නට අයිති ඉඩම ද බස්නාහිරට : එම්. ඒ. සයිමන් ගුණරත්නගේ ඉඩම සහ ප්‍රධාන පාර ද යන මායිම් ඇතුළත පර්චස් විසි අටක් (අ. 0, රූ. 0, ප. 28) නොහොත් හෙක්ටෙයාර 0.0708 ක බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්‍ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

02-426/2

---

**ඩීඑෆ්සීසී බැංකුව**

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්‍ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් එම්. එම්. ජිෆ්රි විසින් ලියා සහතික කරන ලද අංක 4278 හා 2007 නොවැම්බර් මස 29 වැනි දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, 'ඊමන්ස් එන්ටප්‍රයිසස්' යන නාමය අභිධානය සහ ආයතනය යටතේ තනි අයිතිකරු ලෙස ව්‍යාපාරය කරගෙන යන මහනුවර, හම්පෙ ලියනගේ ධර්මදාස යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 ඔක්තෝබර් 31 වන දිනට ඉහත කී අංක 4278 දරන උකස් බැඳුම්කරය මත එකී හම්පෙ ලියනගේ ධර්මදාස යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හතළිස් නව ලක්‍ෂ විසිනව දහස් හයසිය හතළිස් දෙකකුත් ශත පණහක (රු. 49,29,642.50) මුදලක් සහ 2008 නොවැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් නව ලක්‍ෂ දහහතර දහස් අටසිය හතළිහක (රු. 39,14,840) මුදලක් සඳහා ප්‍රතිශෝධනයට යටත් හා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන, පහත දැක්වෙන පාදක පොළී අනුපාතික, එනම්

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ දශම පහට (0.5%) ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය; හෝ

(ආ) රඳවාගැනීමේ බදු අඩු කිරීමෙන් පසු (net of withholding tax), දවස් 91 භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ දශම පහට (0.5%) තීන්දු කරන වාර්ෂික අනුපාතිකය යන මෙයින්, ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට එකොළහක (11%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකයක් මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හතළිස් නව ලක්‍ෂ විසිනව දහස් හයසිය හතළිස් දෙකකුත් ශත පණහක (රු. 49,29,642.50) මුදල සහ 2008 නොවැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් තිස් නව ලක්‍ෂ දහහතර දහස් අටසිය හතළිහක (රු. 39,14,840) මුදලක් සඳහා ප්‍රතිශෝධනයට යටත් හා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් යන මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන, පහත දැක්වෙන පාදක පොළී අනුපාතික, එනම්-

(අ) බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ දශම පහට (0.5%) ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය; හෝ

(ආ) රඳවාගැනීමේ බදු අඩු කිරීමෙන් පසු (net of withholding tax), දවස් 91 භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයට ආසන්නතම ඉහළ දශම පහට (0.5%) තීන්දු කරන වාර්ෂික අනුපාතිකය යන මෙයින්, ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පැවති වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට සියයට එකොළහක (11%) ආන්තිකයක් එකතු කළ අනුපාතිකයක් මත

පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය අනුව හා එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියළු මුදල් හා දරා ඇති සියළු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 4278 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල්

සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 4278 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, මහනුවර මහ නගර සභා බලප්‍රදේශය ඇතුළත, මාවිල්මඩ පිහිටි, "පනික්කි හේනයලෑ නොහොත් හලුඅපුල්ලන හේනයලෑගෙදර වත්ත" නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජී. ආර්. ඩබ්. එම්. වීරකෝන් විසින් මැන සාදන ලද අංක 1971 හා 1985 මාර්තු මස 23 වැනි දින දරන පිඹුරේ දැක්වෙන, ලොට් අංක 1 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කට්ටිය වන උතුරට : ගන්ගහවත්ත ද, නැගෙනහිරට සහ දකුණට : පනික්කි හේනයලෑ නොහොත් හලුඅපුල්ලන හේනයලෑ ගෙදර වත්ත ද, බස්නාහිරට : පාර සහ අංක 1349 දරන පිඹුරේ ලොට් අංක 1 ද යන මායිම් ඇතුළත පර්චස් දහ අටකුත් දශම එකක් (අ. 0, රූ. 0, ප. 18.1) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, ගසකොළ, වැවිලි සහ වෙනත් සියලු දේ. මෙම ඉඩම මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

02-425/2

---

**ඩීඑෆ්සීසී බැංකුව**

**1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම**

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

**අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය**

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් ලියා සහතික කරන ලද අංක 13838 හා 2007.01.09 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, බිංගිරියේ, මුදලිගේ දොන් ටෙරන්ස් රංජිත් නොයෙල් සූරියආරච්චි සහ කුරුකුලසූරිය මරියටා ජෝයිනි රේණුකා ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, 2008 නොවැම්බර් 30 වන දිනට ඉහත කී අංක 13838 දරන උකස් බැඳුම්කරය මත එකී මුදලිගේ දොන් ටෙරන්ස් රංජිත් නොයෙල් සූරියආරච්චි සහ කුරුකුලසූරිය මරියටා ජෝයිනි රේණුකා ප්‍රනාන්දු යන අයගෙන් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් දස ලක්ෂ අනූහත් දහස් එකසිය හතළිස් හයකුත් ශත තිස් දෙකක (රු. 10,97,146.32) මුදලක් සහ 2008 දෙසැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අටලක්ෂ අනූ අට දහස් පන්සිය අනූ හයකුත් ශත හතළිස් අටක් (රු. 8,98,596.48) සඳහා එක් එක් වර්ෂයේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බර තැබූ මධ්‍යයක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් දස ලක්ෂ අනූහත් දහස් එකසිය හතළිස් හයකුත් ශත තිස් දෙකක (රු. 10,97,146.32) මුදල සහ 2008 දෙසැම්බර් මස 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් අටලක්ෂ අනූඅට දහස් පන්සිය අනූහයකුත් ශත හතළිස් අටක් (රු. 8,98,596.48) සඳහා එක් එක් වර්ෂයේ, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතකුත් දශම පහක් (7.5%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලනු ලබන ආසන්නතම ඉහළ 0.5%ට තීන්දු කරන අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම හා පරිශ්‍රය සහ එහි පිහිටි ගොඩනැගිලි විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර එකී උකස් බැඳුම්කරයේ ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියළු මුදල් හා දරා ඇති සියළු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 13838 දරන උකස් බැඳුම්කරය මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය එහි පිහිටි ගොඩනැගිලි සමග කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

**අංක 13838 දරන උකස් බැඳුම්කරය මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කටුගම්පොල හත්පත්තුවේ, යගම්පත්තු කෝරළේ, ගිනිදම්මන ග්‍රාමයේ පිහිටි නවගහවත්ත නමැති ඉඩමේ, බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් මැන සාදන ලද අංක 1805 හා 1998.07.13 දින දරන පිඹුරේ දැක්වෙන, ඉඩමට මායිම්, උතුරට : කුරුණෑගල-හලාවත ප්‍රධාන පාර ද, නැගෙනහිරට : යූ. ඩී. ඇග්නස් හාමිනේ හිමිකම් කියන මෙම ඉඩමේ ඉතිරි කොටස ද, දකුණට : ලොට් අංක 8 දරන බිම් කට්ටිය ද, බස්නාහිරට : ලොට් අංක 7 සහ ටී. පී. අංක 312328 දරන පිඹුරේ දැක්වෙන ඉඩම ද යන මායිම් ඇතුළත රූඩ් දෙකක් (අ. 0, රූ. 2, ප. 0) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගොඩනැගිලි, වැවිලි සහ ඊට ආබද්ධ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

02-426/1

### ඩීඑෆ්සීසී බැංකුව

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය ප්‍රකාර (ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු) ඩීඑෆ්සීසී බැංකුව විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙහි පහත දැක්වෙන යෝජනා සම්මතය ඒකච්ඡන්දයෙන් සම්මත කරගන්නා ලද බව 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තියට අනුකූලව මෙයින් දැනුම් දෙනු ලැබේ.

#### අධ්‍යක්ෂ මණ්ඩල යෝජනා සම්මතය

ලංකා සංවර්ධන මුදල් සංස්ථාව යනුවෙන් කලින් හැඳින්වුණු ඩීඑෆ්සීසී බැංකුව නමට කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එෆ්. ජේ. සී. ඩබ්. පෙරේරා විසින් ලියා සහතික කරන ලද අංක 982 හා 2006.05.08 වන දින දරන උකස් බැඳුම්කරය සහ අංක 1559 හා 2007.12.10 දින දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, "කවිත එන්ජිනියර්ස් " යන නාමය අභිධානය ආයතනය යටතේ හවුල් ව්‍යාපාරයන් ලෙස කුරුණෑගල ව්‍යාපාරය කරගෙන යන, කුරුණෑගල දෙදෙනාම පදිංචි, කමරදිවල ආරච්චිලාගේ නීල් කුමාරසිංහ සහ උඩුවෙල මුහන්දිරම් රාලලාගේ විජයන්ති මාලා විජේකෝන් යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද 2008 නොවැම්බර් 30 වන දිනට ඉහත කී අංක 982 හා 1559 දරන උකස් බැඳුම්කර මත එකී කමරදිවල ආරච්චිලාගේ නීල් කුමාරසිංහ සහ උඩුවෙල මුහන්දිරම් රාලලාගේ විජයන්ති මාලා විජේකෝන් යන අය විසින් ඩීඑෆ්සීසී බැංකුවට රුපියල් හය ලක්ෂ හැත්තෑඅට දහස් හත්සිය නවයකුත් ශත හතළිහක (රු. 6,78,709.40) මුදලක් සහ 2008 දෙසැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්ලක්ෂ හැටනව දහස් පන්සිය හැටක් (රු. 1,69,560) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකටම වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහල අනුපාතිකයක් මත ගණන් බලන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොළිය සහ රුපියල් හාරලක්ෂයක් (රු. 4,00,000) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල ව්‍යාපාරික කටයුතු කරන ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන, මෙහි පහත දැක්වෙන, පාදක පොළී අනුපාතිකය වන, ප්‍රතිශෝධනයට යටත්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) ආසන්නතම ඉහළ සියයට පහක (5%) ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ; හෝ

(ආ) රඳවාගැනීමේ බද්ද අඩු කිරීමෙන් පසු (net of with holding tax) දවස් 91 භාණ්ඩාගාර බිල්පත් සඳහා මධ්‍යක පොළී අනුපාතිකයට වර්ෂයකට ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය, යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පවතින වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට 10.5%ක ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය ද ලැබිය යුතුව හා අයවිය යුතුව ඇති හෙයින් ද,

එම ප්‍රතිශෝධන කාර්ය සඳහා,

(අ) අදාළ බරතැබූ මධ්‍යක ණය පොළී අනුපාතිකය (ඒ. ඩබ්. පී. ආර්.) විය යුත්තේ, ප්‍රතිශෝධන දිනයට පූර්ව සති 12 සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ (ඒ. ඩබ්. පී. ආර්. අනුපාතිකය පළකිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නතර කරනු ලැබුවහොත්) වෙනත් යම් බලධරයෙකු විසින් හෝ පළ කරන ලද බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතික වල මධ්‍යයකය මත ඩීඑෆ්සීසී බැංකුව විසින් ආගණනය කරන මධ්‍යක ඒ. ඩබ්. පී. ආර්. අනුපාතිකය.

(ආ) අදාළ භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකය විය යුත්තේ ප්‍රතිශෝධන දිනයට පූර්ව සති දොළහ (12) සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ (භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකය පළ කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නතර කරනු ලැබුවහොත්) වෙනත් යම් බලධරයෙකු විසින් හෝ පළ කරන ලද දවස් 91 භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකවල මධ්‍යකය ලෙස ඩීඑෆ්සීසී බැංකුව ආගණනය කරන දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකය.

ඉහත කී උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල වන රුපියල් හය ලක්ෂ හැත්තෑ අට දහස් හත්සිය නවයකුත් ශත හතළිහක (රු. 6,78,709.40) මුදල සහ 2008 දෙසැම්බර් 01 වන දින සිට විකිණීමේ දිනය දක්වා එයින් රුපියල් එක්ලක්ෂ හැටනව දහස් පන්සිය හැටක් (රු. 1,69,560) සඳහා එක් එක් වර්ෂයේ සෑම තුන් මසකට වරක් ප්‍රතිශෝධනය කර ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සතිපතා පදනම මත පළකරනු ලබන බරතැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ. ඩබ්. පී. ආර්.) වර්ෂයකට සියයට හතක් (7%) ඉහළ අනුපාතිකයක් මත ගණන් බලන ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන අනුපාතිකය මත පොලිය සහ රුපියල් හාරලක්ෂයක් (රු. 4,00,000) සඳහා එක් එක් වර්ෂයේ ජනවාරි, අප්‍රේල්, ජූලි සහ ඔක්තෝබර් මාසවල ව්‍යාපාරික කටයුතු කර ප්‍රථම දිනයේ දී ප්‍රතිශෝධනය කරන, මෙහි පහත දැක්වෙන පාදක පොළී අනුපාතික වන, ප්‍රතිශෝධනයට යටත්,

(අ) බර තැබූ මධ්‍යක මූලික ණය පොළී අනුපාතිකයට (ඒ.ඩබ්.පී.ආර්) ආසන්නතම ඉහළ සියයට පහක (5%) ට තීන්දු කරන වාර්ෂික අනුපාතිකය ; හෝ

(ආ) රඳවාගැනීමේ බද්ද අඩු කිරීමෙන් පසු (net of withholding tax) දවස් 91 භාණ්ඩාගාර බිල්පත් සඳහා මධ්‍යක පොළී අනුපාතිකයට වර්ෂයකට ආසන්නතම ඉහළ 0.5% තීන්දු කරන වාර්ෂික අනුපාතිකය.

යන මෙයින් ප්‍රතිශෝධන දිනයේ දී බලාත්මකව පවතින වඩා ඉහළ අනුපාතිකයට වර්ෂයකට 10.5%ක ආන්තිකයක් එකතු කළ අනුපාතිකය මත පොළිය හෝ විකිණීමේ දිනට එයින් නොගෙවා ඉතිරිව ඇති යම් කොටසක් මීට අදාළ ඉඩම සහ පරිශ්‍රය විකිණීම පිළිබඳ ප්‍රචාරක ගාස්තු හා විකිණීමේ ගාස්තු ද 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තිය ප්‍රකාර, ඉහත කී අංක 982 හා 1559 දරන උකස් බැඳුම්කරවල ප්‍රතිඥප්ති අනුව ඩීඑෆ්සීසී බැංකුව වැය කර ඇති සියළු මුදල් හා දරා ඇති සියළු වියදම් හා ගාස්තු ද සමග අයකර ගැනීම සඳහා ඉහත කී අංක 982 හා 1559 දරන උකස් බැඳුම්කර මගින් ඩීඑෆ්සීසී බැංකුව වෙත උකස් කර ඇති මෙහි පහත විස්තර කරන ඉඩම සහ පරිශ්‍රය කොළඹ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් සහ සංශෝධිත පරිදි වූ 1955 අංක 35 දරන ලංකා සංවර්ධන මුදල් සංස්ථා පනතින් පැවරී ඇති බලතල යටතේ ඩීඑෆ්සීසී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

එම ප්‍රතිශෝධන කාර්ය සඳහා

(අ) අදාළ බරතැබූ මධ්‍යක ණය පොළී අනුපාතිකය (ඒ.ඩබ්.පී.ආර්.) විය යුත්තේ, ප්‍රතිශෝධන දිනයට පූර්ව සති 12 සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ (ඒ.ඩබ්.පී.ආර්. අනුපාතිකය පළකිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නතර කරනු ලැබුවහොත්) වෙනත් යම් බලධරයෙකු විසින් හෝ පළ කරන ලද බරතැබූ මධ්‍යක මූලික

ණය පොළී අනුපාතිකවල මධ්‍යකය මත ඩීඑෆ්සීසී බැංකුව විසින් ආගණනය කරන මධ්‍යක ඒ.ඩබ්.පී.ආර්. අනුපාතිකය.

(ආ) අදාළ භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකය විය යුත්තේ ප්‍රතිශෝධන දිනයට පූර්ව සති දොළහ (12) සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හෝ (භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකය පළ කිරීම ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නතර කරනු ලැබුවහොත්) වෙනත් යම් බලධරයකු විසින් හෝ පළ කරන ලද දවස් 91 භාණ්ඩාගාර බිල්පත් අනුපාතිකවල මධ්‍යකය ලෙස ඩීඑෆ්සීසී බැංකුව ආගණනය කරන දවස් 91 මධ්‍යක භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකය.

**අංක 982 හා 1559 දරන උකස් බැඳුම්කර මගින් උකස් කරන ලද දේපළ විස්තරය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, වැඩවිල්ලි හත්පත්තුවේ, කුඩාගල්බොඩ කෝරළේ, අස්වැද්දුම ග්‍රාමයේ පිහිටි, අස්වැද්දුම වත්ත නමැති ඉඩමේ, බෙදා වෙන් කළ බිම් කට්ටියක් වන, උතුරට : ලොට් අංක 15 සහ ලොට් අංක 13 ලෙස ලකුණු කළ පාර ද, නැගෙනහිරට : ලොට් අංක 17 ද, දකුණට : ලොට් අංක 25 ද, බස්නාහිරට : අංක 262ඒ/පී දරන පිඹුරේ දැක්වෙන අස්වැද්දුම වත්තේ කොටසක් ද යන මායිම් ඇතුළත බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර විසින් මැන සාදන ලද අංක 60/93 හා 1993 අප්‍රේල් 29 දින දරන පිඹුරේ, ලොට් අංක 16 ලෙස දැක්වෙන, පර්චස් දහසයක (අ. 0, රූ. 0, පර්. 16) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි ගසකොළ, වැවිලි, ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ.

ඒ. එන්. ෆොන්සේකා,
අධ්‍යක්ෂ/සාමාන්‍යාධිකාරී.

ඩීඑෆ්සීසී බැංකුව,
73/5, ගාලු පාර,
කොළඹ 03.

02-426/3

---

**රුහුණ සංවර්ධන බැංකුව - ගන්දර ශාඛාව**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් නිකුත් කරන ලද 1998.04.24 දින දරන අති විශෙෂ ගැසට් නිවේදනයට අනුව පිහිටුවනු ලැබූ රුහුණ සංවර්ධන බැංකුව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2008.10.09 දින පවත්වන ලද රුහුණ සංවර්ධන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලදී :

රුහුණ සංවර්ධන බැංකුව නමට නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් නීතිඥ කේ. එච්. පද්මසිරි මහතා විසින් සහතික කරන ලද 2007.06.06 දිනැති අංක 972 උකස්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම දෙවිනුවර, තංගල්ල පාර, අංක 37 ලිපිනයේ පදිංචි තේනුවර හැන්නදිගේ දයාපාල සහ රත්නායක මුදියන්සේලාගේ කුසුමාවතී යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් නමලක්ෂ අසූ තුන්දහස් තුන්සියයක (රු. 9,83,300) මුදලක් රුහුණ සංවර්ධන බැංකුව වෙත ගෙවීමට ඇති බැවින් ද, 2008.07.31 දින සිට වර්ෂයකට 25% බැගින් රුපියල් නමලක්ෂ අසූතුන්දහස් තුන්සියයක (රු. 9,83,300) මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොළිය හා වෙන්දේසි වියදම් ද සමඟ අනතුරුව කිසියම් මුදලක් ලැබීමට ඇත්නම් ඒවා ද, ඇතුළුව එකී මුදල අයකර ගැනීම සඳහා මාතර බලයලත් වෙන්දේසිකාර ජී. පී. ආනන්ද මහතා විසින් එකී අංක 972 දරන උකස්කරය යටතේ බැංකුවට උකස්කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි එකී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරනු ලැබේ.

**උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තර**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, වැල්ලබඩපත්තුවේ දෙවිනුවර සුළුනගර සභා සීමාව තුළ දෙවිනුවර පිහිටි තංගල්ල පාරේ වරිපනම් අංක 87 දරන මොහොට්ටිගෙවත්ත නමැති ඉඩමට 1985.09.11 දිනැති කුසුමන් සිරිවර්ධන බලයලත් මිනින්දෝරු මහතාගේ අංක 49 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද අංක 02 සහ 03 දරන ඒකාබද්ධ කැබලි වලින් අංක 02 දරන කැබැල්ලෙන් 1998.11.07 දිනැති කුසුමන් සිරිවර්ධන බලයලත් මිනින්දෝරු තැනගේ අංක 117/1985 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද අංක 06 දරන ඉඩම් කැබැල්ලට එම පිඹුර ප්‍රකාර මායිම්: උතුරට - ඉහත කී අංක 117/1985 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද අංක 05 දරන කැබැල්ල ද, නැගෙනහිරට : මෙම ඉඩමේ අංක 07 දරන පාර ද, දකුණට : මාතර-තංගල්ල මහපාර ද, බස්නාහිරට : අංගහවත්ත පාර ද, මායිම් තුළ පිහිටි පර්චස් විසිදෙකයි දශම බිංදුවයි අටක් (අ. 0, රූ. 0, ප. 22.08) විශාල ඉඩමේ සහ එහි තුළ තිබෙන වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දෙයද වේ. මෙම ඉඩම බී 459/255 හි මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි වී ඇත.

එකී ඉඩම මාතර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ B 631/148 වං 39/318 හි ලියාපදිංචි වී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

අමරසේන ප්‍රතාපසිංහ,
සාමාන්‍යාධිකාරී.

2008 ඔක්තෝබර් මස 06 වැනි දින,
රුහුණ සංවර්ධන බැංකුව,
ප්‍රධාන කාර්යාලය, පඹුරන, මාතර.

02-393

---

**රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව**

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : කේයූ18/00603/කේයූ1/246.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2007.10.20 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. කුලියාපිටිය ප්‍රසිද්ධ නොතාරිස් ඒ. එම්. ජී. ප්‍රේමචන්ද්‍ර විසින් සහතික කරන ලද 2005.09.18 වැනි දින හා අංක 3831 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, කුලියාපිටිය පදිංචි විරක්කොඩිගේ සිරිපාල සහ පටපිලිගේ අයිරින් ප්‍රනාන්දු යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.10.10 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් පන්ලක්ෂ තිස්හය දහස් හත්සිය විසිඅටයි ශත අසූනවය (රු. 5,36,728.89)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 3831 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය තිස් එකයි ශත හැට (රු. 231.60) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න) ;

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, කුරුණෑගල, මල්කඩුවාව, වටරවුම් පාර, ගම්මඩුගොල්ල මාවත, අංක 15හි බලයලත් වෙන්දේසිකාර බී. එම්. ඒ. විජයතිලක මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ පිදුම ගමේ කරගහපිටියවත්ත සහ මදුගහමුලවත්ත වර්තමානයේ අස්වැද්දුම ගම නමැති ඉඩමෙන් බලයලත් මින්දෝරු එස්. එම්. දිසානායක විසින් මැන සකසන ලද 1999.01.02 දින හා අංක 7844 දරන පිඹුරේ කැබලි අංක 2 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0, පර්. 16ක් වූ බෙදා වෙන් කළ බිම් කොටස වේ.

මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ පත්ඉරු අංක ජේ 140/232හි ලියාපදිංචි වී ඇත.

තවද, 7844 දරන පිඹුරේ කැබලි අංක 13 (අඩි 15ක් පළළ) මතින් ඇති මාර්ග අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

02-456/5

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැනුණු යෝජනාව

ණය අංකය : කේයූ19/00203/කේයූ1/076.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2008.09.08 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

"1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එම්. යූ. රාජපක්ෂ විසින් සහතික කරන ලද 2004.06.24 වැනි දින හා අංක 8953 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම, නල්ලදරන්කට්ටුව පදිංචි චන්ද්‍රසේකර හේරත් හිටිහාමි කෝරාලලාගේ නිම්මි නිලන්ති සහ වික්‍රමනායක ආරච්චිගේ ඩොනල්ඩ් යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.08.30 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් හාරලක්ෂ අසූහයදහස් නවසිය විසිහතයි ශත තිස්පහ (රු. 4,86,927.35)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 8953 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් දෙසිය දහයයි ශත එකොළහ (රු. 210.11) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, මීගමුව, ප්‍රනාන්දු මාවත, අංක 22හි බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

පුත්තලම් දිස්ත්‍රික්කයේ, හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ උතුරු පිටිගල් කෝරළයේ ආනවිලුන්දන් පත්තුවේ නල්ලදරන්කටුව ගමේ පිහිටි රොමානිවත්ත නමැති ඉඩමේ රජයේ මිනුම්පති විසින් සකසන ලද 1993.09.02 දින බෙදා වෙන් කර සහතික කර සකසන ලද මුල් අංක පීයූ 3332 දරන පිඹුරේ කැබලි අංක 6 ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 2, පර්. 2.63ක් වූ බිම් කොටස. තවද, එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියලු දේත් සහ එහි ඇති මාර්ග අයිතිය ද වේ.

මෙය හලාවත ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඩී 135/100 දරන පත්ඉරුව යටතේ ලියාදිංචි වී ඇත.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

02-456/4

---

## රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

1981හි අංක 62 දරන පනතින් හා 1984හි අංක 29 දරන පනතින් සංශෝධිත පරිදි 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගැණුනු යෝජනාව

ණය අංක : 1/38385/සීඩී4/709, එස්-1/49582/ඒඕ1/112,
1/53300/සීඩී9/551.

රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය 2008.10.20 වැනි දින පැවැත්වුණු රැස්වීමේ දී පහත සඳහන් අයුරු විශේෂයෙන් හා ඒකමතිකව තීරණය කරන ලදී :

1. කොළඹ ප්‍රසිද්ධ නොතාරිස්වරුන් වන ඩී. බුද්ධදාස, පී. ඒ. සී. කේ. නියතපාල සහ එස්. වී. පී. කුරේ විසින් සහතික කරන ලද 1999.07.14, 2006.05.05 සහ 2006.10.27 දිනයන් හා අංක 2510, 2980 සහ 946 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම, මාලඹේ පදිංචි විතානගේ හෙම්දු ශ්‍රී සම්පත් පෙරේරා සහ ගම්ලස්සගේ අනුෂා නිල්මිණී කුමාරි යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, 2008.09.25 දිනට මුල් ණය මුදල හා එය මත පොළී වශයෙන් රුපියල් තුන්ලක්ෂ විසිතුන්දහස් පන්සිය හැත්තෑ හතරයි ශත අනූවක, රුපියල් අටලක්ෂ පනස්හය දහස් දෙසීය හැටහයයි ශත විසිහයක සහ රුපියල් හයලක්ෂ දහ දහස් දෙසීය අසූ හයයි ශත විසි නවයක (රු. 3,23,574.90, රු. 8,56,266.26 සහ රු. 6,10,286.29)ක මුදලක් ද, පූර්වෝක්ත බැඳුම්කර අංක 2510, 2980 සහ 946 ප්‍රකාර ගෙවිය යුතු මුදල සම්පූර්ණයෙන් ගෙවා නිම කරන දිනය වනතුරු දිනකට රුපියල් එකසිය පනස් නවයයි ශත පනස් හත, රුපියල් තුන්සිය අසූ එකයි ශත විසිඑක සහ රුපියල් දෙසීය හැත්තෑ පහයි ශත අසූඅට (රු. 159.57, රු. 381.21 සහ රු. 275.88) බැගින් වැඩිපුර පොළිය ද අයවිය යුතුව ඇති බැවින් ද, (මෙදිනට පසු කරන ලද ගෙවීම් අඩු කරන්න)

2. මෙම දැන්වීමේ පළමුවැනි ඡේදයේ දක්වා ඇති එකී මුදල සහ 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 57 වැනි වගන්තිය යටතේ අයකර ගත යුතුව ඇති වියදම් හා මුදල් ආපසු අයකර ගැනීම උදෙසා මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති හා රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුවට උකස්කර ඇති දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා සංශෝධන සහිත 1975හි අංක 13 දරන රාජ්‍ය උකස් හා ආයෝජන බැංකු පනතේ 50 වැනි වගන්තිය ප්‍රකාර, නුගේගොඩ, පාගොඩ පාර, අංක 3හි බලයලත් වෙන්දේසිකාර ඊ. අර්වින් පෙරේරා මහතාට බලය පැවරිය යුතු වන්නේ ය.

### උපලේඛනය

කොළඹ දිස්ත්‍රික්කයේ, කඩුවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, හෝකන්දර පිහිටි දඹුගහවත්ත නමැති ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ජේ. පී. අයි. අබේකෝන් විසින් 1996.11.03 වැනි දින මැන සකසන ලද අංක 5482 දරන පිඹුරේ කැබලි අංක සී ලෙස බෙදා වෙන්කර දැක්වෙන ප්‍රමාණයෙන් අ. 0, රූ. 0. පර්. 10ක් වූ බිම් කොටස වේ.

මෙය හෝමාගම් ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ වෙළුම් පත් අංක ඊ 1642/13හි ලියාපදිංචි කර ඇත.

තවද, බලයලත් මිනින්දෝරු එස්. ජෙගතීසන් විසින් 1961.06.23 වැනි දින සකසන ලද අංක 862 පිඹුරේ කැබලි අංක සී ලෙස බෙදා වෙන් කර ඇති බිම් කොටස මතින් පාර සඳහා වෙන් කර ඇති අයිතිය ද සමග වේ.

එස්. ඒ. වීරසිංහ,
සාමාන්‍යාධිකාරී.

2009 පෙබරවාරි මස 06 වැනි දින,
අංක 269,
ගාලු පාර, කොළඹ 03.

02-456/6

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230001307.

ණයකරුගේ සම්පූර්ණ නම : ප්‍රභාත් අසංග සමන්සිරි රතුගමගේ
ඇටර්නි බලකාර විතාරනගේ උදුලා
පුෂ්පලතා රොඩ්රිගෝ.

ජා-ඇළ ප්‍රසිද්ධ නොතාරිස් සී. එස්. ප්‍රනාන්දු විසින් ලියා සහතික කරන ලද අංක 1463 හා 2002.11.02 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධිත) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් තුන්ලක්ෂ හැටහත් දහස් එකසිය හැත්තෑතුනයි ශත පනස් තුනක (රු. 3,67,173.53) මුදලක් වර්ෂ 2007.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් දෙලක්ෂ අසූතුන් දහස් පනස් දෙකයි ශත අසූ දෙකක (රු. 2,83,052.82) මුදල ද, වර්ෂ 2007.07.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් අසූහතර දහස් එකසිය විස්සයි ශත හැත්තෑඑකයි (රු. 84,120.71) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් තුන්ලක්ෂ හැටහත් දහස් එකසිය හැත්තෑතුනයි ශත පනස් තුනක (රු. 3,67,173.53) ද,

(2) එකී රුපියල් දෙලක්ෂ අසූතුන් දහස් පනස් දෙකයි ශත අසූ දෙකක (රු. 2,83,052.82) මුදල මත අයවිය යුතු වර්ෂයකට 17.90% බැගින් වන පොලියක් 2007.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ ඔක්තෝබර් මස 02 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛන

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අළුත්කුරු කෝරළේ, දාසිය පත්තුවේ, බණ්ඩාරවත්ත ග්‍රාමයේ ස්කාගාර පාරේ, වරිපනම් අංක 89/2හි

පිහිටි ගොඩකඳුරුගහවත්ත නමැති ඉඩමට 1993.08.24 දින ජේ. පී. අයි. අබේකෝන් මානක තැන විසින් මැන සම්පාදිත පිඹුරු අංක 473හි ලොට් 2බී ට මායිම්, උතුරට : පිඹුරු අංක 917/66හි ලොට් 1 දරන ඉඩම ද, නැගෙනහිරට : පිඹුරු අංක 917/66හි ලොට් 3 දරන ඉඩම ද, දකුණට : ලොට් 2ඒ ද, බටහිරට : ලොට් 2ඒ ද යන මායිම් තුළ පිහිටි පර්චස් අටයි දශම දෙකයි පහක (අ. 0. රූ. 0, පර්. 8.25) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී864/10හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

02-504

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0230000705 සහ 0233300209.

ණයකරුගේ සම්පූර්ණ නම : ලලිත් වසන්ත අතුකෝරළ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් පී. ඒ. සී. පී. ගනේපොල විසින් ලියා සහතික කරන ලද අංක 2213, 4210 හා 1996.03.08, 1999.11.24 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ අසූහයදහස් දෙසිය හැත්තෑ හතරයි ශත අසූහතක (රු. 1,86,274.87) මුදලක් වර්ෂ 2007.07.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් එක්ලක්ෂ හැටදහස් හාරසිය හැටදෙකයි ශත තිස්අටක (රු. 1,60,462.38) මුදල ද වර්ෂ 2005.07.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිපන්දහස් අටසිය දොළහයි ශත හතලිස් නවයක් (රු. 25,812.49) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ අසූහයදහස් දෙසිය හැත්තෑ හතරයි ශත අසූහතක (රු. 1,86,274.87) ද,

(2) එකී රුපියල් එක්ලක්ෂ හැටදහස් හාරසිය හැටදෙකයි ශත තිස්අටක (රු. 1,60,462.38) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15%, 15.50% බැගින් වන පොලියක් 2005.08.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2005ක් වූ සැප්තැම්බර් මස 07 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, රාගම් පත්තුවේ, අළුත්කුරු කෝරළේ, කටාන ප්‍රාදේශීය සභා සීමාවේ රද්දොළුව ග්‍රාමයෙහි පිහිටි මිගහවත්ත නමැති ඉඩමට 1995.09.19 වැනි දින කේ. ආර්. එස්. ෆොන්සේකා මානක තැන විසින් මැන සම්පාදිත අංක 1219බී පිඹුර ප්‍රකාර ලොට් 4ඒ2බීට මායිම්, උතුරට : පිඹුරු අංක 1219බීහි ලොට් 4ඒ2ඒ සහ ලොට් 4ඒ2සී ද, නැගෙනහිරට : බලයලත් මානක කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සාදන ලද පිඹුරු අංක 1190හි ලොට් 4සී ද, දකුණට : දෙපා ඇළ ද, බටහිරට : බලයලත් මානක කේ. ආර්. එස්. ෆොන්සේකා විසින් සාදන ලද පිඹුරු අංක 1219හි ලොට් 4ඒ1 ද යන මායිම් තුළ පිහිටි පර්චස් දහතුනක් (අ. 0, රූ. 0, පර්. 13) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 125/208හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

02-501

---

## ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 0233300274.

ණයකරුගේ සම්පූර්ණ නම : බියන්විලගේ ඔස්වල්ඩ් ට්‍රෙවෝ ශාමන්ත පෙරේරා.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. සී. පී. ගනේපොල විසින් ලියා සහතික කරන ලද අංක 2464 හා 1996.08.15 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී

ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් එක්ලක්ෂ නවසිය හැත්තෑ තුනයි ශත විසිඅටක (රු. 1,00,973.28) මුදලක් වර්ෂ 2007.04.30 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑ හයදහස් නවසිය අසූහතයි ශත තුනක (රු. 76,987.03) මුදල ද වර්ෂ 2007.04.30 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිතුන්දහස් නවසිය අසූහයයි ශත විසිපහක (රු. 23,986.25) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් එක්ලක්ෂ නවසිය හැත්තෑ තුනයි ශත විසිඅටක (රු. 1,00,973.28) ද,

(2) එකී රුපියල් හැත්තෑ හයදහස් නවසිය අසූහතයි ශත තුනක (රු. 76,987.03) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15%බැගින් වන පොලියක් 2007.05.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. වික්‍රමරත්න යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූ ල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2007ක් වූ මැයි මස 30 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, දාසියපත්තුවේ, අළුත්කුරු කෝරළේ, සීදුව කටුනායක නගර සභා සීමාවේ සීදුව වෝඩ් අංක 10 මිෂන් හවුස් පාරේ වරිපනම් අංක 24/9 පිහිටි කෝන්ගහවත්ත නමැති ඉඩමට 1996.03.07 දින කේ. ඊ. ජේ. බී. පෙරේරා මානක තැන විසින් මැන සම්පාදිත අංක 4400 පිඹුර ප්‍රකාර ලොට් 3බීට මායිම්, උතුරට සහ නැගෙනහිරට : බී. ජේ. ඩී. එන්. පොන්සේකාට අයිති කැබලි අංක 3ඒ ද, දකුණට : අඩි 12 පළල පාර ද, බටහිරට : කේ. එච්. ගුණදාසට අයිති ඉඩම ද යන මායිම් තුළ පිහිටි පර්චස් දොළහයි දශම හතරයි අටක් (අ. 0, රූ. 0, පර්. 12.48) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියලු දේද මාර්ග පරවශතාවය ද සමග මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 741/178හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

02-503

---

### ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව

(කලින් කල සංශෝධිත) 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය

ණය අංකය : 1803300468.

ණයකරුගේ සම්පූර්ණ නම : සරත්තිලක සමරසිංහ ආරච්චිලාගේ තුෂාර ඉන්දික විජේරත්න.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් සී. එම්. සී. බෝගොල්ලාගම විසින් ලියා සහතික කරන ලද අංක 15990 හා 1996.09.25 දින දරන උකස්කරය මගින් මෙහි පහත උපලේඛනයේ විස්තර කර ඇති දේපළ මෙහි මින් මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන (2003 අංක 15 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා (සංශෝධන) පනතින් සංශෝධිත) 1997 අංක 07 දරන ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ඉහත කී ණයකරු විසින් ඉහත කී උකස්කරය යටතේ උකස් කරන ලදුව අයවිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින්,

එකී උකස් බැඳුම්කරය යටතේ රුපියල් අනූනමදහස් අටසිය හතලිස්හතයි ශත පහළොවක (රු. 99,847.15) මුදලක් වර්ෂ 2004.12.31 දින වන විට ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට ලැබිය යුතුව ඇති හෙයින්,

(1) එකී ණය මුදලෙන් ආපසු නොගෙවූ සම්පූර්ණ කොටස වන රුපියල් හැත්තෑඅටදහස් හයසිය හතලිස්දෙකයි ශත හැත්තෑහයක (රු. 78,642.76) මුදල ද වර්ෂ 2004.12.31 වැනි දින දක්වා පොලිය වශයෙන් රුපියල් විසිඑක්දහස් දෙසිය හතරයි ශත තිස්නමයක් (රු. 21,204.39) ද වශයෙන් සම්පූර්ණ එකතුව රුපියල් අනූනමදහස් අටසිය හතලිස්හතයි ශත පහළොවක් (රු. 99,847.15) ද,

(2) එකී රුපියල් හැත්තෑඅටදහස් හයසිය හතලිස්දෙකයි ශත හැත්තෑහයක (රු. 78,642.76) මුදල මත අයවිය යුතු වර්ෂයකට 15%බැගින් වන පොලියක් 2005.01.01 දින සිට දේපළ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම කරන දිනය දක්වා (එම දින දෙකම ඇතුළුව) අයකර ගැනීම සඳහා,

(3) එකී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ විශේෂ විධිවිධාන පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකළ හැකි මුදල් සහ ගාස්තු ද,

අයකර ගැනීම සඳහා (තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් එකී මුදල් අඩු කොට) ඉහත කී උකස් බැඳුම්කරය මගින් ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව වෙත උකස්කොට ඇත්තාවූ මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කොට ඇත්තාවූ දේපළ හා පරිශ්‍රය ප්‍රසිද්ධ වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල යන අය ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂ 2008ක් වූ පෙබරවාරි මස 21 වැනි දින පැවැති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඒකමතිකව යෝජනා සම්මත කර ගන්නා ලදී.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙණි හත්පත්තුවේ, රෙකෝපත්තු කෝරළේ, පඹේ සහ වීදුරු වැල්ල ග්‍රාමයන්හි පිහිටි පිදුරුවැල්ල

එස්ටේට් නමැති ඉඩමට 1995.09.30 වැනි දින සරත් වෙලගෙදර මානක තැන විසින් මැන සම්පාදිත අංක 3512 පිඹුර ප්‍රකාර ලොට් 41ට මායිම්, ඊසානට : ලොට් 42 ද, ගිණිකොණට : ලොට් 13 ද, නිරිතට : ලොට් 40 ද, වයඹට : ලොට් 52 ද යන මායිම් තුල පිහිටි පර්චස් පහළොවක (අ. 0, රූ. 0, පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් සියළු දේද මාර්ග පරවශතාවය ද සමග කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ f 1076/230හි ලියාපදිංචි කර ඇත.

ඉහත නම සඳහන් සංස්ථා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි ය.

සාමාන්‍යාධිකාරී.

02-502

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - මීගමුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.10.29 වැනි දින පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

කච්චකඩුගේ ප්‍රශාන්ත ඇන්ටන් ප්‍රනාන්දු විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ගොඩ්රි කුරේ විසින් සහතික කරන ලද අංක 5747 සහ 2006 නොවැම්බර් මස 20, අංක 5839 සහ 2007 මැයි මස 29 සහ අංක 5911 සහ 2007 දෙසැම්බර් මස 11 වැනි දින දරන උකස්කරන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත 2008 සැප්තැම්බර් මස 05 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් අසූනම ලක්ෂ දහසය දහස් පන්සිය හැත්තෑ දෙකයි ශත අසූ එක (රු. 89,16,572.81)ක මුදල සහ එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් විසිහතර ලක්ෂ පනස් දහස (රු. 24,50,000) ක් සහ රුපියල් විසිහතර ලක්ෂ අනූඑක් දහස් හතලිස් හතයි ශත හැට (රු. 24,91,047.60)ක මුදල මත 2008 සැප්තැම්බර් මස 06 වැනි දින සිට වර්ෂයකට 29% බැගින් පොලිය ද, රුපියල් තිස්පන් ලක්ෂ හැත්තෑ පන්දහස් තුන්සියය තිස් හතරයි ශත හැත්තෑව (රු. 35,75,334.70)ක මුදල මත 2008 සැප්තැම්බර් මස 01 වැනි දින සිට වර්ෂයකට 38% බැගින් පොලිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්

එකී අංක 5747, 5839 සහ 5911 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් අසූනම ලක්ෂ දහසය දහස් පන්සියය හැත්තෑ දෙකයි ශත අසූඑක (රු. 89,16,572.81) ක මුදල සහ ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව්, අංක 474 මහානාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන ආර්. එස්. එම්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ අලුත්කුරු කෝරළේ, දූනගහ පත්තුවේ, කිඹුලාපිටිය පිහිටි දැනට එක් ඉඩමක් වන කඳුරුගහවත්ත සහ දෙල්ගහවත්ත සහ කෝන්ගහවත්ත කඳුරුගහවත්ත පාලුගහලන්ද, කිරිනුගගහවත්ත හෙවත් කඳුරුගහවත්ත මූලමල්ගහවත්ත හෙවත් කඳුරුගහවත්ත, කඳුරුගහවත්තේකැබැල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ඩී. නන්දන සෙනෙවිරත්න විසින් මැන සාදන ලද අංක 423 සහ 1988 ජූලි මස 19 වැනි දින දරන සැලැස්ම පරිදි උතුරට : මීගමුව සිට අලුත්පොල දක්වා වූ මහා මාර්ගය, නැගෙනහිරට : එම්. මෝසස් පෙරේරාගේ ඉඩම සහ එම්. මාර්ටින් පෙරේරාට සහ අනෙක් අයට අයත් ඉඩම්, දකුණට : විමල් පීරිස්ගේ මාලිගාගොඩැල්ලවත්ත සහ බස්නාහිරට : සිසිලි මේරි ග්‍රේස්ගේ ඉඩම යන මායිම් තුළ ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් එකයි දශම නමයයි තුන (අ. 1, රූ. 3, පර්. 1.93)ක් විශාල එකී අංක 423 දරන සැලැස්මේ ලොට් 3 සහ 4 වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති එකිනෙකට යාබද බිම් කැබැලි සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේද වේ.

නුදුරු යලි මැනුමක් අනුව එකී යාබද ලොට් 3 සහ 4 යන ඉඩම් පහත දැක්වෙන අයුරින් විස්තර කෙරේ :

ඉහත කී කිඹුලාපිටිය පිහිටි දැනට එක් ඉඩමක් වන කඳුරුගහවත්ත සහ දෙල්ගහවත්ත සහ කෝන්ගහවත්ත කඳුරුගහවත්ත, පාලුගහලන්ද කිරිනුගගහවත්ත හෙවත් කඳුරුගහවත්ත, මූනමල්ගහවත්ත හෙවත් කඳුරුගහවත්ත, කඳුරුගහවත්තේකැබැල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. එස්. එස්. පෙරේරා විසින් මැන සාදන ලද අංක 5610/1 සහ 2006.06.03 දින දරන සැලැස්ම පරිදි, උතුරට : පාර (අධිවේගී මාර්ගය), නැගෙනහිරට : එම්. ගෝර්ති පෙරේරාගේ ඉඩම සහ විමල් පීරිස්ගේ මාලිගාගොඩැල්ලවත්ත, දකුණට : විමල් පීරිස්ගේ මාලිගාගොඩැල්ලවත්ත සහ බස්නාහිරට : සිසිලි මේරි ග්‍රේස්ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර එකයි රූඩ් තුනයි පර්චස් දෙකයි දශම පහයි පහක් (අ. 1, රූ. 3, පර්. 2.55)ක් විශාල එකී සැලැස්මේ දැක්වෙන බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි ඇතුලු සියලු දේද වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

02-488/4

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - වත්තල ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.17 වැනි පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

පැලියගොඩගේ නිශාන්ත ප්‍රදීප් විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1417 සහ 2004 සැප්තැම්බර් මස 16 වැනි දින දරන උකස්කරන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත 2008 නොවැම්බර් මස 23 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් හාරලක්ෂ අසූනම දහස් පනස් තුනයි ශත තිස් දෙක (රු. 4,89,053.32)ක මුදල සහ එකී උකස්කරය මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් හාරලක්ෂ හැටතුන් දහසක (රු. 4,63,000) ක මුදල මත 2008 නොවැම්බර් මස 24 වැනි දින සිට වර්ෂයකට 27% බැගින් පොලිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්

එකී අංක 1417 දරන උකස්කරය යටතේ අයවිය යුතු එකී රුපියල් හාරලක්ෂ අසූනම දහස් පනස් තුනයි ශත තිස් දෙක (රු. 4,89,053.32) ක මුදල සහ 2008 නොවැම්බර් මස 24 වැනි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද එකී 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, බැද්දගාන පාරේ අංක 134 හි බලයලත් වෙන්දේසිකරු වන පී. කේ. ඊ. සේනාපති වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස

**උපලේඛණය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ දකුණ, රාගම් පත්තුවේ, වත්තල මාබෝල නගර සභා සීමාව තුළ තෙලඟපාත පිහිටි (බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 6209 සහ 1981.09.20 වැනි දිනැති සැලැස්මේ ලොට් සී දරන බිම් කැබැල්ලේ කොටසක් වන) තෙලඟපාත පාරේ වරිපනම් අංක 103/9 දරන පොකුණබොඩවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු හියු ආර්. සමරසිංහ විසින් මැන සාදන ලද අංක 1420 සහ 1991.09.26 දරන සැලැස්ම පරිදි, උතුරට : පාර (අංක 6209 සැලැස්මේ ලොට් ඊ), නැගෙනහිරට : මෙම ඉඩමේ ඉතිරි කොටස, දකුණට : පාර සහ බස්නාහිරට : අංක 6209 දරන සැලැස්මේ ලොට් ඩී දරන ඉඩම් කැබැල්ල යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හතයි දශම පහයි බිංදුවක් (අ. 0, රූ. 0, පර්. 7.50)ක් හෝ හෙක්ටයාර් 0.0190ක් විශාල එකී අංක 1420 සැලැස්මේ ලොට් 1 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු ආදී සියල්ල ද වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 719/102 වෙළුම/පත්ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

02-488/3

---

**පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී - මීගමුව ශාඛාව**

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.17 වැනි පවත්වන ලද රැස්වීමකදී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී :-

වෙද සුරංග ද සිල්වා විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට මීගමුව ප්‍රසිද්ධ නොතාරිස් එන්. එල්. ජී. කුරේ විසින් සහතික කරන ලද අංක 5613 සහ 2006 ජනවාරි 17, අංක 5701 සහ 2006 අගෝස්තු 01 සහ අංක 5977 සහ 2008 අප්‍රේල් 22 වැනි දින දරන උකස්කරන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත 2008 නොවැම්බර් මස 10 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් තිස්එක් ලක්ෂ හැටඅට දහස් නමසිය හැත්තෑ තුනයි ශත හතළිහ (රු. 31,68,973.40)ක මුදල සහ එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් රුපියල් දහනම ලක්ෂ තිස්නම දහස් පන්සීය හැත්තෑ නමයයි ශත දහහත (රු. 19,39,579.17) ක මුදල මත 2008 නොවැම්බර් මස 11 වැනි දින සිට වර්ෂයකට 26% බැගින් පොලිය ද, රුපියල් දසලක්ෂ අනූ අට දහස් හත්සිය තුනයි ශත අනූ හතරක (රු. 10,98,703.94) මුදල මත 2008 නොවැම්බර් මස 01 වැනි දින සිට වර්ෂයකට 38% බැගින් පොලිය ද, පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්

එකී අංක 5613, 5701 සහ 5977 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් තිස්එක් ලක්ෂ හැටඅට දහස් නමසීය හැත්තෑ තුනයි ශත හතළිහ (රු. 31,68,973.40) ක මුදල සහ ඉහත කී දිනයන්හි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ

(විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව් අංක 474, මහානාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන ආර්. එස්. එම්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස

### උපලේඛණය

1. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ කටාන ප්‍රාදේශීය සභාවේ රද්දොළුව උප කාර්යාල සීමාව තුළ දඹදූරේ පිහිටි බෝගහවත්ත සහ ගාල්ල නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 2902 සහ 1974 ජූනි මස 11 වැනි දින දරන සැලැස්ම පරිදි උතුරට : එකී සැලැස්මේ ලොට් 36, නැගෙනහිරට : යූ. සිල්වාගේ ඉඩම, දකුණට : එකී සැලැස්මේ ලොට් 39 සහ 38 සහ බස්නාහිරට : එකී සැලැස්මේ ලොට් 31 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20)ක් විශාල එකී අංක 2902 දරන සැලැස්මේ ලොට් 37 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර ඇති බෙදා වෙන් කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලු දේද වේ.

2. බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ කටාන ප්‍රාදේශීය සභාවේ රද්දොලුව උප කාර්යාල සීමාව තුළ දඹදූරේ පිහිටි බෝගහවත්ත සහ ගාල්ල නමැති ඉඩමට ඉහත කී අංක 2902 සහ 1974 ජූනි මස 11 වැනි දින දරන සැලැස්ම පරිදි උතුරට : එකී සැලැස්මේ ලොට් 37 ද. නැගෙනහිරට : එකී සැලැස්මේ ලොට් 39, දකුණට : එකී සැලැස්මේ ලොට් 44 සහ බස්නාහිරට : එකි සැලැස්මේ ලොට් 31 යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් විස්ස (අ. 0, රූ. 0, පර්. 20)ක් විශාල එකී අංක 2902 දරන සැලැස්මේ ලොට් 38 බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලු දේද වේ.

ඉහත කී ලොට් 37 සහ 38 යන බිම් කැබලි දෙක බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද 2005 සැප්තැම්බර් මස 06 වැනි දිනැති අංක 8691 දරන සැලැස්මෙන් ඒකාබද්ධ කරන ලද අතර පහත දැක්වෙන පරිදි විස්තර කෙරේ.

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීගමුව ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, කටාන ප්‍රාදේශීය සභාවේ රද්දොලුව උප කාර්යාල සීමාව තුළ දඹදූරේ පිහිටි බෝගහවත්ත සහ ගාල්ල නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු කේ. ඊ. ජේ. බී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 8691 සහ 2005 සැප්තැම්බර් මස 06 දිනැති සැලැස්ම පරිදි උතුරට : නිමල් තෝනිස්ට හිමි එකී ඉඩමේ ලොට් 36, නැගෙනහිරට : ගාමිනීට අයිති ඉඩම සහ පත්මාවතීට අයත් එකී ඉඩමේ ලොට් 39, දකුණට : පත්මාවතීට අයත් එකී ඉඩමේ ලොට් 39 සහ බස්නාහිරට : එකී ඉඩමේ ලොට් 31 (දැනට ප්‍රාදේශීය සභා පාර) යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ. 0, රූ. 1, පර්. 20) විශාල එකී අංක 8691 දරන සැලැස්මේ දක්වා ඇති බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි සියලු දේ සහ මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී199/104හි ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෝෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

02-488/2

## පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී - වත්තල ශාඛාව

1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වැනි වගන්තිය යටතේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.12.17 වැනි පවත්වන ලද රැස්වීමක දී විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

එනම්-

හීතකේ ලැන්ට් කැමිල්ටන් සිල්වා විසින් කලින් පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පැන් ඒෂියා බැන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුණ ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ජේ. ආර්. දොලවත්තගේ විසින් සහතික කරන ලද අංක 1364 සහ 2004 ජූලි 19 සහ අංක 2663 සහ 2007 ජූනි 14 වැනි දින දරන උකස්කරන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

එකී උකස්කරයන් මත 2008 නොවැම්බර් මස 02 වැනි දින දක්වා මුල් මුදල සහ පොලිය වශයෙන් රුපියල් පන්ලක්ෂ විසිපන් දහස් තුන්සිය හැත්තෑ හතරයි ශත හතලිස් නමය (රු. 5,25,374.49)ක මුදල සහ එකී උකස්කරයන් මත ගෙවිය යුතු සම්පූර්ණ මුදල ගෙවා නිම කරන දින තෙක් 2008 නොවැම්බර් මස 03 වැනි දින සිට රුපියල් හාරලක්ෂ දහනම දහස් දෙසීය දෙකයි ශත හැටදෙක (රු. 4,19,202.62) ක මුදල මත වර්ෂයකට 30% බැගින් පොලිය ද, රුපියල් පස් අටදහස් තුන්සිය තිස්තුනයි ශත හතලිස් අට (රු. 58,333.48) ක මුදල මත වර්ෂයකට 28% බැගින් පොලිය ද, පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී (මෙහි මින්මතු බැංකුව යනුවෙන් හඳුන්වනු ලබන) වෙත අයවිය යුතුව සහ ලැබිය යුතුව තිබෙන හෙයින් ද,

පහත සඳහන් පරිදි යෝජනා සම්මත කරගනු ලැබේ. ඒ කෙසේ ද යත්

එකී අංක 1364 සහ 2363 දරන උකස්කරයන් යටතේ අයවිය යුතු එකී රුපියල් පන්ලක්ෂ විසිපන් දහස් තුන්සිය හැත්තෑ හතරයි ශත හතලිස් නමය (රු. 5,25,374.49) ක මුදල සහ 2008 නොවැම්බර් මස 03 වැනි සිට විකිණීමේ දිනය දක්වා ඉහත සඳහන් පරිදි ලැබිය යුතු පොලිය ද, ගාස්තු ද එකී අංක 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි මුදල් ද අයකර ගැනීම සඳහා බැංකුවට උකස්කර ඇත්තා වූ ද මෙහි උපලේඛනයෙහි වඩා සම්පූර්ණ ලෙස විස්තර කර ඇත්තා වූ ද, දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කෝට්ටේ, පිටකෝට්ටේ, මහානාම ඩ්‍රයිව් අංක 474, මහානාම ඔක්ෂන්ස් හි බලයලත් වෙන්දේසිකරු වන ආර්. එස්. එම්. මහානාම වෙත 1990 අංක 04 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය පරිදි අධිකාරය සහ බලය පවරන ලෙස

### උපලේඛණය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අලුත්කුරු කෝරළේ, රාගම් පත්තුවේ, වත්තල මාබෝල නගර සභා සීමාව තුළ වත්තල කොළඹ පාරේ පිහිටි දැනට කොළඹ පාරේ වරිපනම් අංක 190 දරන සුදුවිකුඹුර නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එම්. ඩී. ජේ. වී. පෙරේරා විසින් මැන සාදන ලද අංක 16170 සහ 1999.11.30 වැනි දින දරන සැලැස්ම පරිදි උතුරට : බලයලත් මිනින්දෝරු හියු ආර්. සමරසිංහ විසින් මැන සාදන ලද අංක 1764 සහ 1993 අප්‍රේල් 07 දිනැති සැලැස්මේ ලොට් 3 (අඩි 12ක් පළල පාර) සහ ඉහත කී අංක 16710 සැලැස්මේ ලොට් 'X' දරන ඉඩම් කැබැල්ල, නැගෙනහිරට : ඉහත කී අංක 16710 සැලැස්මේ ලොට් 'X' දරන ඉඩම්

කැබැල්ල, දකුණට ඃ දැනට හැටන් නැෂනල් බැංකුව සතු මෙම ඉඩමේම තවත් කොටසක් සහ බස්නාහිරට ඃ මීගමුව සිට කොළඹ දක්වා වූ මහා මාර්ගය යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් පර්චස් හයයි දශම හතයි පහ (අ. 0, රූ. 0, පර්. 6.75)ක් හෝ හෙක්ටයාර් 0.0171ක් විශාල එකී අංක 16710 දරන සැලැස්මේ ලොට් ‘Y’ බිම් කැබැල්ල වශයෙන් ලකුණු කර බෙදා වෙන්කොට සීමා නිර්ණය කර ඇති බිම් කැබැල්ල සහ එහි තුළ පිහිටි ගොඩනැගිලි සහ සියලු දේද වේ. කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ බී 864/42 වෙලුම/පත්‍ඉරුවේ ලියාපදිංචි කර ඇත.

එකී අංක 1764 දරන සැලැස්මේ ලොට් 2 සහ 3 මත මාර්ග අයිතිය සහ අනෙකුත් අයිතීන් ද සමග වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

රංජිට් පෙරේරා,
ජ්‍යෙෂ්ඨ කළමනාකරු-ණය අයකර ගැනීම්.

02-488/1

---

## සෙලාන් බැංකුව පීඑල්සී - වැලිමඩ ශාඛාව

(2007 අංක 07 දරන සමාගම් පනත අනුව යොමුව පීකිව් 09 යටතේ ලියාපදිංචි කර ඇත.)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද සම්මුතිය

ගිණුම් අංකය ඃ 0570-01161702-001.

සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008.11.06 දින පවත්වන්නට යෙදුනු රැස්වීමේදී 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ විශේෂයෙන් සහ ඒකමතිකව පහත සඳහන් අයුරු සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ ඃ

සෙලාන් බැංකුව පීඑල්සී නමට ලියන ලද (2007 අංක 07 දරන සමාගම් පනත යටතේ යොමු අංක පීකිව් 09 යටතේ ලියාපදිංචි කර ඇත) ප්‍රසිද්ධ නොතාරිස් සුහයිරා fපලික් විසින් තුනම සහතික කරන ලද 2004 මැයි 03 දිනැති අංක 271, 2004 මැයි 03 දිනැති අංක 272 සහ 2005 පෙබරවාරි 22 දිනැති අංක 355 දරන බැඳුම්කර මත අයවිය යුතු මුදල් ගෙවීම දෙදෙනාම කැප්පෙටිපොළ පදිංචි වීරසේකර මුදියන්සේලාගේ රූපසිංහ සහ මාපා මුදියන්සේලාගේ හිමාලි එරංගිකා යාපා යන අය බන්ධනදායීන් වශයෙන් පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කර යටතේ රුපියල් නවලක්ෂ හතලිස්එක්දහස් අටසිය තිස්අටයි ශත හතලිස්හතක (රු. 9,41,838.47) මුදලක්, 2007 අගෝස්තු මස 20 වැනි දින වන විට සෙලාන් බැංකුව පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව ඇති හෙයින් ද එකී රු. 9,41,838.47 මුදල ද, 2007 අගෝස්තු මස 21 වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට එම මුදලට වර්ෂයකට සියයට තිස් තුන (33%) බැගින් වූ පොලිය සමග ප්‍රසිද්ධ කිරීමේ වියදම් සහ දරන්නට යෙදුනු වෙනත් ගාස්තු ද තදනන්තරව ලැබී ඇති යම් මුදලක් (ඇත්නම්) එම මුදල අඩුකර අයකර ගැනීම පිණිස ඉහත කී අංක 271, 272 සහ 355 දරන බැඳුම්කර මගින් සෙලාන් බැංකුව පීඑල්සී වෙත උකස්කර ඇත්තාවූ මෙහි පහත සඳහන් උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇති දේපළ බලයලයත් වෙන්දේසිකාර අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට, 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත මගින් පැවරී ඇති බලතල අනුව සෙලාන් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### උපලේඛනය

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, උඩ පළාත කෝරළේ, උඩුකිඳ පාළුගම පිහිටි බලයලත් මිනින්දෝරු ඩී. පී. රූපසිංහ විසින් සාදන ලද 1996.12.11 දිනැති අංක 5 දරන සැලැස්ම අනුව ගොඩමුනේ කුඹුර වත්ත නමැති ඉඩමේ නොබෙදූ බාග (1/2) කොටසට මායිම්, උතුරට ඃ නුවරඑළිය දිසාවට ප්‍රධාන පාර ද, නැගෙනහිරට ඃ දෙවට පාර ද, දකුණට ඃ අගල සහ බස්නාහිරට ඃ නුවරඑළිය දිසාවට පාර සහ වැටිය යන මායිම් තුළ රූඩ් තුනයි, පර්චස් තිස්පහයි දශම පහක් (අ. 0, රූ. 3, පර්. 35.5) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම. මෙය බදුල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 410/895 හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු එස්. පී. රත්නායක විසින් සාදන ලද 2000.02.04 දිනැති අංක 1842ඒ දරන සැලැස්මේ ලොට් 4 ලෙස පෙන්නුම් කරනු ලබන සහ පෙර කී පාළුගම පිහිටි ගොඩමුනේ කුඹුරේ වත්ත නමැති ඉඩම් කොටසට මායිම්, උතුරට ඃ කන්දේ ඇල ද, නැගෙනහිරට ඃ පාර ද, දකුණට ඃ ආර්. එල්. ලෙනෝරා විසින් හිමිකම් කියනු ලබන ඉඩම හා බස්නාහිරට ඃ ලොට් 3 යන මායිම් තුළ පර්චස් තිහක් (අ. 0, රූ. 0, පර්. 30) විශාල ගොඩනැගිලි සහ එහි පිහිටි වෙනත් සියලු දේ සමග ඉඩම.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

එම්. කේ. ප්‍රේමතිලක,
සහකාර සාමාන්‍යාධිකාරි-නීති.

02-509

---

## හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී.- බලංගොඩ ශාඛාව

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව නමින් හඳුන්වනු ලැබූ)

### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ හැටන් නැෂනල් බැන්ක් පී එල් සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනා සම්මුතිය

2008 ක් වූ නොවැම්බර් මස 27 වැනි දින පවත්වන ලද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ රැස්වීමේ දී මතු දැක්වෙන යෝජනාව විශේෂයෙන්ම සහ ඒකඡන්දයෙන් සම්මත කර ගන්නා ලදී.

රත්නපුර ප්‍රසිද්ධ නොතාරිස් ආර්. එම්. සී. ආර්. ඩී. රාජපක්ෂ විසින් සහතික කරන ලද්දා වූ ද හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2007.05.17 දින සහ අංක 127 දරන බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, නිකලන්ද වත්ත ප්‍රේමතිලක සහ නිකලන්ද වත්ත පියල් උදයකුමාර ණයකරුවන් හැටියට, පැහැර හැර ඇති හෙයින් එකී බැඳුම්කරය යටතේ රුපියල් හයලක්ෂ හැත්තෑහත්දහස් හත්සිය අසූපහයි ශත හැත්තෑහය (රු. 6,77,785.76) ක මුදලක් 2008.06.30 දින වන විට හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. ට අයවිය යුතුව සහ ලැබිය යුතුව ඇති හෙයින් එකී රු. 6,77,785.76 ක මුදලට 2008.07.01

වැනි දින සිට විකිණීමේ දිනය දක්වා කාලයට වැඩිදුර පොළිය ද, ප්‍රචාරක වියදම් සඳහා දරන ලද වියදම් සහ වෙනත් ගාස්තු හා මුදල් ප්‍රමාණයන් ද තදනන්තරව ගෙවන ලද යම් මුදලක් වේ නම් ඒ මුදල අඩු කොට එකී අංක 127 දරන උකස් බැඳුම්කරය මගින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත උකස් කොට ඇත්තා වූ ද මෙහි පහත උපලේඛනයේ සවිස්තරව විස්තර කර ඇත්තා වූ ද දේපළ හා පරිශ්‍රය කොළඹ ප්‍රසිද්ධ වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යයි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පවරා ඇති බලතල යටතේ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අධ්‍යක්ෂ මණ්ඩලය මේ මගින් යෝජනා සම්මත කර ගනී.

### උපලේඛනය

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, මැද කෝරළේ, උඩ පත්තුවේ, බලංගොඩ සුළු නගර සභා සීමාව තුළ වතුකරගොඩ ගමෙහි පිහිටි වරිපනම් අංක 34/6ඒ වන "කරවුකෙටිය වත්ත-උස් බිම" නමැති ඉඩමට බලයලත් මානක එම්. සමරසේකර විසින් මැන සාදන ලද අංක 5582 සහ 1999 අප්‍රේල් මස 20 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද 'ලොට් 18' ලෙස ලකුණු කර ඇති ඉඩම් කොටස වන උතුරට : පිඹුරු අංක 5582ට අයත් ලොට් 11න් ද, නැගෙනහිරට : පිඹුරු අංක 5582ට අයත් ලොට් 3හි මාර්ග පරවශතා අයිතියෙන් ද, දකුණට : පිඹුරු අංක 5582ට අයත් ලොට් 19ඒ වලින් ද සහ බස්නාහිරට : එම ඉඩමේම කොටසකින් ද මායිම් වූ පර්චස් දහය (අ. 0, රූ. 0, පර්. 10)ක් විශාල ඉඩමට අයත් ගොඩනැගිලි සහ අනෙකුත් සියළුම දේත් සමග වේ. මෙය රත්නපුර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 287/163 ශීර්ෂය යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ඉන්ද්‍රාණි ගුණසේකර,
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිණී (නීති),
මාණ්ඩලික ලේකම්.

02-506

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

#### 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාර (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 දෙසැම්බර් මස 18 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ :

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ධනුෂ්කි ලියනපටබැඳි විසින් සහ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ඩබ්ලිව්. එම්. පූර්ණි ප්‍රභාර්ශිණී නිල්මි මහීපාල විසින් පිළිවෙලින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු බැඳුම්කර වශයෙන් හඳුන්වනු ලබන) පිළිවෙලින් අංක 203 සහ 2005 ජුනි මස 28 වැනි දින දරන උකස් බැඳුම්කරය සහ අංක 200 සහ 2006 ජූලි මස 17 දින ද දරන ද්විතීයික බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) බොරලැස්ගමුව දිවුලපිටිය, පන්සල පාරේ, අංක 56/1 දරන ස්ථානයේ පදිංචි අමරදිවාකර ආරච්චිගේ දොන් සුසන්ත විජේතුංග යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝර්ක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති හෙයින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කර මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කර මත 2008.10.21 වැනි දිනට නිවාස ණය දෙක මත මුළු හිඟ මුදල වශයෙන් රුපියල් දාහත් ලක්ෂ හැටඅටදහස් හයසිය තිස්තුනකුත් ශත හතලිස් හයක මුදලක් (රු. 17,68,633.46) වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද ,

ඉහත කී රුපියල් දාහත්ලක්ෂ හැටඅටදහස් හයසියතිස් තුනකුත් ශත හතලිස්හයක මුදල (රු. 17,68,633.46) සහ පළමුවන නිවාස ණය මත ගෙවිය යුතු මුදල් වශයෙන් රුපියල් දසලක්ෂ අසූතුන්දහස් තුන්සිය පනස්අටකුත් ශත හැටහයක මුදල (රු. 10,83,358.66) මත 2008.10.22 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 27% බැගින් තවදුරටත් පොළිය ද දෙවන නිවාස ණය මත ගෙවිය යුතු මුල් මුදල වශයෙන් රුපියල් හාරලක්ෂ අනූහයදහස් පනස් නවයකුත් ශත හැටහතරක මුදල (රු. 4,96,059.64) මත 2008.10.22 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 19.68% බැගින් තවදුරටත් පොළිය ද, තවද සම්බන්ධිත ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, රයිගම් කෝරළයේ, කුඹුකේ පත්තුවේ, ඔලබොඩුව පිහිටි නානාබිගේවත්ත සහ අඹගහවත්ත (නමුත් පිඹුරේ නානාබිගේවත්ත සහ අඹගහවත්ත වශයෙන් විස්තර කරන ලද) ඉඩමට බලයලත් මිනින්දෝරු ඩී. අනුර ධර්මසිරි විසින් මැන සාදන ලද අංක 2600 සහ 2004 මැයි මස 09 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ ලොට් C නමැති බිම් කොටසට මායිම්, උතුරට : ලොට් A, D (මීටර් 4.5ක් පළල පාර සඳහා වෙන් කිරීම) සහ B ද, නැගෙනහිරට : ලොට් B ද, දකුණට : මාරාගහවත්ත හෙවත් මාරාගහලන්ද ද, බස්නාහිරට : අංක 892 දරන පිඹුරේ ලොට් 01 ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 2600 දරන පිඹුර අනුව රූඩ් එකකුත්, පර්චස් දහඅටක (අ. 0, රූ. 1, පර්. 18) විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් ගහකොළ, පළතුරු ආදී සෑම සියළු දේත් සමග ය. මෙය හොරණ දිසා ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C 238/150 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තවද ඉහත කී අංක 2600 දරන පිඹුරේ නිරූපිත ලොට් D මතින් ගමන් කිරීමේ මාර්ග අයිතිය සහ වෙනත් ඊට සමාන අනුබද්ධ අයිතිවාසිකම්

ද ලොට් D සිට ගෝනපොල ඔලබෝදූව පාර දක්වා දිවෙන පාර සඳහා වෙන් කිරීම ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

02-505/1

---

### නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මතය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව (ලියාපදිංචි අංක PQ 118 දරන) නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී හි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2008 දෙසැම්බර් මස 18 වැනි දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ:

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් සජීවනී කල්පනා මුණවීර ජයවර්ධන විසින් ලියා සහතික කරන ලද (මෙහි මින්මතු බැඳුම්කරය වශයෙන් හඳුන්වනු ලබන) අංක 787 සහ 2005 ඔක්තෝබර් මස 03 දින දරන උකස් බැඳුම්කරය මගින් මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය (මෙහි මින්මතු උකස්කරු වශයෙන් හඳුන්වනු ලබන) කෑගල්ල, නෙලුම්දෙණිය, ඉහළගම, "ගල්කොටුව" පදිංචි මානන්නලාගේ ශාන්ත විජේසිංහ යන අය විසින් ලබාගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් එකී උකස්කරු විසින් (කලින් කොළඹ 01, යෝර්ක් වීදියේ අංක 76 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් ලිමිටඩ් වශයෙන් හඳුන්වනු ලැබූ) කොළඹ 02, යූනියන් පෙදෙසේ, අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමට උකසට තබා බැඳීමකට යටත් කර ඇති හෙයින් ද,

තවද ඉහත කී උකස්කරු ඉහත කී බැඳුම්කරය මගින් ඇප තබන ලද එකී පහසුකම් මත ලැබිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදු කරන ලදුව එකී බැඳුම්කරය මත 2008.10.27 වැනි දිනට රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් පන්සිය විසිහයකුත් ශත අනූනවයක මුදලක් (රු. 2,45,526.99) වර්තමානයේ දී ඉහත කී නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී වෙත ලැබිය යුතුව සහ අයවිය යුතුව පවතින බැවින් ද,

ඉහත කී රුපියල් දෙලක්ෂ හතලිස්පන්දහස් පන්සිය විසිහයකුත් ශත අනූනවයක මුදලක් (රු. 2,45,526.99) සහ 2008.10.27 වැනි දිනට නිවාස ණය මත ගෙවිය යුතු මුල් මුදල වශයෙන් රුපියල් එක්ලක්ෂ හැත්තෑහයදාහක මුදල (රු. 1,76,000) මත 2008.10.28 වැනි දින සිට විකිණීමේ දිනය තෙක් වර්ෂයකට 27% බැගින් තවදුරටත් පොළිය ද, ඊට සම්බන්ධ ව්‍යවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් ගාස්තු ප්‍රමාණයන් ද පහසුකම ලබාගත් දින සිට ගෙවා ඇති (යම් මුදලක් වෙතොත්) එම මුදල අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය ට්‍රියඩ් ඔක්ෂනියර්ස් විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

#### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළයේ, උඩුගහ පත්තුවේ, වේවැල්දෙණිය පහළගම පිහිටි කොහොඹගහවත්ත, දෙල්ගහවත්ත සහ ගලබොඩවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. ඒ. ඩී. ඒ. සේනානායක විසින් මැන සාදන ලද අංක 1513 සහ 2004 මැයි මස 02 දිනැති පිඹුර ප්‍රකාර ලොට් 5 දරන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්, උතුරට : මෙම පිඹුරේ ලොට් 6 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ ලොට් ආර් 1 ද, දකුණට : ලොට් 4 ද, බස්නාහිරට : මෙම පිඹුරේ කුඹුර ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 1513 දරන පිඹුර අනුව පර්චස් දහයක (අ. 0, රූ. 0, පර්. 10) හෙවත් හෙක්ටයාර් 0.0253ක විශාල බිම් කැබැල්ල සහ ඊට අයත් ගහකොළ, පළතුරු ආදිය සෑම සියළු දේද සමග ය. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එප් 289/39 දරන වෙළුමේ/පත්‍රයේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී අංක 1513 දරන පිඹුරේ නිරූපිත ලොට් ආර්1 සහ ආර්6 දරන ඉඩම් කැබලි මතින් ගමන් කිරීමේ පොදු මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242, යූනියන් පෙදෙස,
කොළඹ 02.

02-505/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

A3 - B 079986